# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2350/42 – 2023 සැප්තැම්බර් මස 20 වැනි බදාදා – 2023.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2017/107.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.02.18 දිනැති හා අංක 2215/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.02.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. තුම්මෝදර, බටහිර කළුටුවාව, කෝරළ මායිම් පාර, අංක 166 හි පදිංචි එන්. ජී. විල්සන් මයා 2. හංවැල්ල, කලුඅග්ගල, රත්නපුර පාර, අංක 47 හි පංදිචි එච්. පී. එස්. හේවාවසම් මයා (වර්තමානයේ කලුඅග්ගල සිරිවිමලසාර හිමි) සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 20/2021 හා 2023.08.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 040369 – 18 (2023/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

ගොනු අංකය: IR/COM/02/2017/107
නඩු අංකය: A/20/2021

01. එන්. පී. විල්සන් මයා,
අංක 166, කෝරළ මායිම් පාර,
බටහිර කළුවාව,
තුම්මෝදර.

2. එච්. පී. එස්. හේවාවසම් මයා
අංක 47, රත්නපුර පාර,
කලුඅග්ගල, හංවැල්ල.

එදිරිව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
200, කිරුළ පාර,
කොළඹ 05.

## ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා), දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කර ඇත.

මෙම ආරාවුල මුලින්ම 2018.06.25 වන දින අංක A/41/2018 හා A/47/2020 යටතේ සුනෙත් ලොකුබෝගහවත්ත මහතා වෙත කම්කරු හා වෘත්තීය සමිති අමාත්‍ය ගරු රවීන්ද්‍ර සමරවීර මහතා විසින් යොමුකර තිබූ අතර 2021.02.15 වන දින කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් මා පත් කොට ඇත.

මෙම ආරවුලෙහි යොමුව මෙසේය,

''එන්. ජී. විල්සන් මයා හා එච්. පී. එස්. හේවාවසම් මයා (වර්තමානයේ බලපිටියේ සිරිඥාණවංස හිමි සහ කලුඅග්ගල සිරිවිමලසාර හිමි) වන සේවයින් දෙදෙනා ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවයට මුලින්ම බැඳී ඇත. එවකට ලංකා ගමනා ගමන මණ්ඩලයේ අනුමත අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දී, 1991 දී ඇති වූ ජනතාකරණ ක්‍රියාවලියෙන් පසුව ජනතාසන්තක බස් සමාගම්වල සේවකයන් බවට පත්කර ලංගම අනුමත අර්ථසාධක අරමුදලෙන් ඉවත් කර සේවක අර්ථ සාධක අරමුදල් සාමාජිකත්වය ලබාදී නැවත 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල පනත අනුව හා 2011 අංක 11 දරන ශ්‍රී ලංගම චක්‍ර ලිපිය අනුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයන් බවට පත් වූ පසු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල අනුමත අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය ලබා නොදීම නිසා, යම් අසාධාරණයක් සිදු වී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට ලැබිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.''

2011 වසරේ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය නිසා 2022 වසර දක්වාම බේරුම්කරණ ක්‍රියාවලිය ප්‍රමාද විය.

ඒ අතර පළමු වන ඉල්ලුම්කරු වන එන්. ජී. විල්සන් මහතා බලපිටියේ සිරි ඥාණවංස ලෙසින් ද දෙවන ඉල්ලුම්කරු වන එච්. පී. එස්. හේවාවසම් මහතා කලු අග්ගල සිරි විමලසාර ලෙසින් ද පැවිදි වී ඇත.

ඒ අතර මෙම නඩුවේ මුල් අංක වන ඒ/41/2018 හා ඒ/47/2020 වෙනුවට ඒ/20/2021 යොද ඇත.

2022.02.07 වන දින මෙම ආරාවුල විභාගයට ගත් අවස්ථාවේ දී සියළු කරුණු දිවුරුම් පෙත්සම් මගින් ඉදිරිපත් කිරීමට බේරුම්කරු වන මම නියෝග කළෙමි.

මෙම නඩුවේ කරුණු මෙසේය.

2018.07.24 දිනැතිව - ඉල්ලුම්කාර එන්. පී විල්සන් හා එච්. පී. එස්. හේවාවසම් යන දෙදෙනා ඉදිරිපත් කළ කරුණු අනුව,

ඔවුන් දෙදෙනා ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවයට 1972 මුලින්ම බැඳී ඇත.

ඔවුන්ට ලංකා ගමනා ගමන මණ්ඩලයේ අනුමත අර්ථ සාධක අරමුදලේ සාමාජිකත්වය ලබාදී ඇත.

1991 දී ඔවුන් ලංගම යේ සේවයෙන් ඉවත් කොට ජනතා සන්තක බස් සමාගම්වල සේවකයන් බවට පත් කර ඇත. එවිට ඔවුන් ලංගම අනුමත අර්ථ සාධක අරමුදලෙන් ඉවත් කොට සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකත්වය ලබා දී ඇත.

නැවත 2001 දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන් බවට පත්කර ඇත.

දෙපාර්ශ්වය ඉදිරිපත් කළ කරුණු අනුව අයකර ගනිමින් තිබූ සේවකයාගෙන් 10% ක් හා සේවායෝජකයාගෙන් 15% ක් වන ක්‍රමය 1991 දී වෙනසකට භාජනය වී සේවකයාගෙන් 8% ක් ද, සේවායෝජකයාගෙන් 12% ලෙස වෙනස් කිරීම නිසා සේවකයාට මූල්‍යමය වශයෙන් පාඩවක් වී ඇත් ද යන්න තීරණය කළ යුතුව ඇත.

මේ සඳහා තීරණයකට එළඹීමට නම් එක් එක් වකවානුවේ එක් ආයතනවලින් ඔවුන් ලැබූ වැටුප් පිළිබඳ සම්පූර්ණ විස්තරයක් අවශ්‍ය වේ. මක් නිසා ද යත් අර්ථ සාධක අරමුදලට බැර කෙරෙන්නේ වැටුපෙන් ප්‍රතිශතයක් බැවින්ය.

2022.02.18 වන දින එන්. පී. විල්සන් හෙවත් පසුව බලපිටියේ සිරි ඥානවංශ ස්වාමින් වහන්සේ ඉදිරිපත් කළ දිවුරුම් පෙත්සම කෙරෙහි අවධානය යොමු කළෙමි.

එම දිවුරුම් පෙත්සමේ 4 වන 5 වන ඡේද අනුව 1991 සිට 2010 දක්වා අවුරුදු 19 යි මාස 8 ක කාලයක් තිස්සේ අර්ථ සාධක අරමුදලට ගෙවන ලද මුදල් ඊට හිමි පොළී අඩු වී ඇත. ඒ අනුව රු. 3,000,000,00 ක අලාභයක් සිදු වි ඇති බව උන්වහන්සේ කියා සිටී.

මේ ගැන තීරණය කිරීමට නම් 1991 සිට 2010 දක්වා ඉල්ලුම්කරුට ගෙවූ වැටුප් විස්තර අවශ්‍යව ඇත.

2022.02.07 වන දින මෙම නඩුව බේරුම්කරණය ඉදිරියට පමුණු වනු ලැබූ අවස්ථාවේ මා නියෝග කළේ 1991 පෙබරවාරි මස සිට 2010 අගෝස්තු මස දක්වා මෙම ඉල්ලුම්කරුවන්ට ගෙවන ලද වැටුප් සියල්ලේම වාර්තාවන් ඉදිරිපත් කරන මෙන්ය.

ඒ ඒ ආයතනවලින් ඉල්ලුම්කරුවන් ලබාගත් වේතන පිළිබඳ විස්තර ඉදිරිපත් කරන මෙන් බේරුම්කරු විසින් පාර්ශ්වකරුවන්ගෙන් බොහෝ වාරයක් ඉල්ලා සිටින ලදී.

2022.10.18 දින බේරුම්කරණය කැඳවූ අවස්ථාවේ දී නිරීක්ෂණය වූයේ ඉහත කී විස්තර පාර්ශ්වයන් දෙකට ඉදිරිපත් කර නැති බවයි. තව ද, ඉල්ලුම්කරුවන් බේරුම්කරණයට පැමිණ නැත. එක් එක් වකවානුවල ලැබූ වැටුප් විස්තර ඉදිරිපත් කිරීමට 2022.10.18 දින තවත් අවස්ථාවක් දෙන ලදී. තව ද, එදින බේරුම්කරු නියෝග කළේ එකී විස්තර දීම පාර්ශ්වයන් නොසළකා හැරියහොත් හෝ අපොහොසත් වුවහොත් පැමිණිල්ල නිෂ්ප්‍රභ කරන බවයි.

2022.11.01 වන දින බේරුම්කරුගේ නියමය පරිදි සහකාර කම්කරු කොමසාරිස් පී. එල්. එස්. ලේකම්ගේ මහත්මිය ඉල්ලුම්කරුට ලිපියකින් දන්වා ඇත්තේ එක් එක් වකවානුවල එක් එක් ආයතනවලින් ලබාගත් වේතන පිළිබඳ විස්තරයක් දිවුරුම් ප්‍රකාශ මගින් ඊළඟ කැඳවීම් දිනයට පෙර ඉදිරිපත් කරන මෙන්ය.

අර්ථ සාධක අරමුදලට ගෙවන මුදල් ඔවුන් ලබන වැටුප්වල ප්‍රතිශතයකි. එබැවින් 1991 දී එම ප්‍රතිශතය වෙනස් කිරීම නිසා ඉල්ලුම්කරුවන්ට කොපමණ ආලාභයක් සිදු වූයේ ද යන්න නිගමනය කිරීම සඳහා - ඔවුන් 1991 සිට 2010 දක්වා ලැබූ මාසික වේතනවල සම්පූර්ණ විස්තර අවශ්‍ය වේ. මෙම දත්තයන් සැපයීමේ සම්පූර්ණ වගකීම ඉල්ලුම්කරුවන් සතුය. 2023.01.16 දින බේරුම්කරණයට දෙපාර්ශ්වයම පැමිණ නැත. ඉල්ලුම්කරුවන් එම දත්ත ඉදිරිපත් නොකරන බැවින් ඉල්ලුම්කරුවන්ගේ පැමිණිල්ලේ මූල්‍යමය සහනයන් ඉල්ලීම නිෂ්ප්‍රභ කිරීම හැර කළ හැකි දෙයක් නැත.

එම කරුණු කෙසේ වෙතත් ඉල්ලුම්කරුවන් ඉල්ලා ඇති පරිදි නිදහස් වාර ප්‍රවේශ පත්‍රයක් හිමිකම ඇති බව 2020.02.11 වන දින මගේ පූර්වගාමී බේරුම්කාර සුනෙත් ලොකුබොගහවත්ත මහතා තීන්දු කර ඇත.

පූර්වගාමී බේරුම්කරුගේ නියෝගය මෙසේ ය,

''පුබුදුගම හා අවිස්සාවේල්ල අතර ගමනා ගමනය සඳහා 01 වන ඉල්ලුම්කරුට නිදහස් ගමන් වාර ප්‍රවේශ පත්‍රයක් හිමි බවට තීන්දු කරමි.'' තව ද, පූර්වගාමී බේරුම්කරුගේ නියෝගයේ අවසාන ඡේදය අනුව, '' 2019 වර්ෂය සඳහා මසකට රු. 500.00 බැගින් වසරක් සඳහා රුපියල් 6000.00 ක් හිමි විය යුතුය.''

ඒ අනුව එන්. පී. විල්සන් මහතාට හා එච්. පී. එස්. හේවාවසම් මහතාට රුපියල් හයදහස බැගින් ගෙවීමට නියම කරමි.

ඒ අනුව පූර්වගාමී බේරුම්කරුගේ නියෝගය අනුමත කරමින් 01 වන ඉල්ලුම්කරුට නිදහස් ගමන් බලපත්‍රයක් නිකුත් කරන මෙන් ද, ඔවුන්ට රුපියල් 6000 ක් බැගින් ගෙවන මෙන් ද මම ප්‍රදානයක් ලෙස නියෝග කරමි.

නිදහස් වාර ප්‍රවේශ පත්‍රයක් දීමෙන් වගඋත්තරකාර පාර්ශ්වයට කිසිදු පාඩුවක් සිදු නොවේ. මෙය නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත *ගැසට්* ගත කිරීමෙන් මසක් ඇතුලත තැන්පත් කරන මෙන් වගඋත්තර පාර්ශ්වයට නියෝග කරමි.

මෙය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**විජිතානන්ද මඩවලගම,**
බේරුම්කරු.

2023 අගෝස්තු මස 11 වැනි දින,

EOG 09-0193

---

මගේ අංකය: IR/COM/03/2019/78.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.11.28 දිනැති හා අංක 2251/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.11.21 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 08, ලෙස්ලි රණගල මාවත, බන්ධනාගාර නිල නිවාස, අංක 121/11 හි පදිංචි එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, කඩුවෙල පාර, අංක 475 හි පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.06.16 දිනැති අංක A 123/2019 දරන ප්‍රදානය පළ කරණු ලැබූ 2022.08.25 දිනැති හා අංක 2294/45 දරන *ගැසට් නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම සඳහා* 2023.08.29 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 සැප්තැම්බර් මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2022 අගෝස්තු මස 25 දින 2294/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ප්‍රදානය

සංශෝධනය

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

එස්. ප්‍රියානි මල්කාන්ති මර්තීනු,
අංක 121/11, බන්ධනාගාර නිල නිවස,
ලෙස්ලි රණගල මාවත,
කොළඹ 08,

*(පළමු පාර්ශ්වය)*

යොමු අංකය : IR/COM/03/2019/78
නඩු අංකය : A/123/2019

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවතින ආරාවුල

**ප්‍රදාන පත්‍රයේ දෝෂ නිවැරදි කිරීම**

2022 අගෝස්තු මස 25 දින ප්‍රසිද්ධ කරන ලද අංක 2294/45 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උක්ත ආරාවුල පිළිබඳව ප්‍රදානය පහත සඳහන් ලෙස සංශෝධනය විය යුතුය.

2001.10.01 දින සිට VI ශ්‍රේණියේ උසාවි ලිපිකරු ලෙස ස්ථිර පත්වීම් ලැබූ ඉල්ලුම්කාරියට මාණ්ඩලික සහකාර V වන ශ්‍රේණියේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ අයට දෙන ලද පත්වීම් දිනය වන 2007.09.17 දින සිට V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දී ඊට අදළ වැටුප් තලයේ පිහිටුවා හිඟ වැටුප් ගෙවීමට ද IV වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක තනතුරට සුදුසුකම් ලැබූ 2009.09.17 දින සිට සහකාර අධ්‍යක්ෂ තනතුරේ පිහිටුවා හිඟ වැටුප් ගෙවීමට ද ඉන් පසු වර්ෂ 03 ක් ඉක්මවීමෙන් පසුව බඳවා ගැනීමේ පටිපාටිය අනුව ලැබිය යුතු නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරු පුරප්පාඩු පවතීනම් ලබාදීමටත් ඉල්ලුම්කාරියට ලබාදිය යුතු සහනයන් ලෙස නියෝග කරමි. මෙම ප්‍රදානය යුක්ති සහගත සහ සාධාරණ බව ප්‍රකාශ කරමි. එමෙන්ම මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළවී මාසයක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු යැයි නිගමනය කරමි. අදාළ ගෙවීම් සිදුකර ඒ බව නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය. තව ද, එම ප්‍රදානයේ ඇතුළත් අනෙකුත් කරුණුවල වෙනසක් නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

එච්. ආර්. එල්. සුගතදාස,
බේරුම්කරු.

2023 අගෝස්තු මස 29 වැනි දින,
බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

EOG 09 - 0194

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.